# FOREIGN FINANCE
# (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# ගෙවුම් තුලන ලේඛනයේ උපනතීන්

ගෙවුම් තුලන ලේඛනයේ 2013 සිට 2016 දක්වා ගිණුම්වල උපනතීන් පහත දැක්වෙන සංඛ්‍යා ලේඛන වගුවෙන් පෙන්නුම් කරයි.

| වර්ෂය | භාණ්ඩ සහ සේවා ගිණුමේ ශේෂය | ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය | ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය | ජංගම ගිණුමේ ශේෂය | ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | මූල්‍ය ගිණුමේ ශේෂය | සමස්ත ගිණුමේ ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| 2012 | - 8155 | -1219 | 5392 | -3982 | 130 | 4263.4 | 151.2 |
| 2013 | - 6429 | -1817 | 5639 | -2607 | 71 | 30637 | 958.4 |
| 2014 | - 6407 | -1808 | 6227 | -1988 | 58.3 | -1536.1 | 1369 |
| 2015 | - 6105 | -2097 | 6193 | -2008.5 | 46.3 | -2312.3 | -149 |
| 2016 | - 6211 | - 2184 | 6453 | - 1942 | 26 | 2199 | - 500 |

ඉහත වගුව මගින් ප්‍රාථමික ආදායම් ගිණුමේ පවතින හිඟය ඉහළ යාම පෙන්නුම් කරන අතර එම හිඟය ජංගම ගිණුමේ හිඟය කෙරෙහි බලපා ඇත.

ද්විතීයක ආදායම් ගිණුමේ ශුද්ධ ශේෂය අතිරික්තයක් පෙන්නුම් කරන අතර එය ක්‍රමක් ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්නුම් කරයි. එය ඉහළ යාම නිසා ජංගම ගිණුමේ හිඟය අඩු වේ.

ClassWork.LK

2010 වර්ෂයේ සිට මූල්‍ය ගිණුම ධන අගයක් ගෙන ඇතත් 2014 සිට හිගයක් පෙන්නුම් කරයි.

ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ ශේෂය දීර්ඝ කාලීන හිගයක් පෙන්නුම් කරයි.

එය 1977 වර්යේ දි පමණක් ධන අගයක් ගෙන ඇති අතර ආර්ථිකය විවෘත වීමත් සමග දීර්ඝ කාලීන හිගයක් පෙන්නුම් කරයි.

ජංගම ගිණුමේ ශේෂය ලබා ගන්නේ වෙළෙඳ ශේෂය, සේවා ශේෂය, ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය සහ ද්විතියක ආදායම් ගිණුමේ ශේෂය එකට ගැළපීමෙන් ය.

ජංගම ගිණුමේ ශේෂය හිගය තීව්‍රතාවට වෙළෙඳ ශේෂය සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය සෘණ අගයක් ගැනීම හේතු වී ඇත.

ශ්‍රී ලංකාවේ ජංගම ගිණුමේ ශේෂය දීර්ඝ කාලීන හිගයක් පවතී.

භාණ්ඩ ගිණුම් ශේෂය (වෙළෙඳ ශේෂය) දීර්ඝ කාලීන හිගයක් පෙන්නුම් කරයි.

ClassWork.LK

සේවා ගිණුමේ අතිරික්තයක් පෙන්නුම් කරයි.

භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය පසුගිය වසර කීපය තුළ උච්චාවචනයට ලක් වී ඇත.

භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂයේ පවතින හිඟය පිළිබඳ දත්ත විශ්ලේෂණයක් පහත දැක්වෙන සංඛ්‍යා ලේඛන වගුවෙන් ඉදිරිපත් කෙරේ.

| වර්ෂය | භාණ්ඩ ගිණුමේ ශේෂය | සේවා ගිණුමේ ශේෂය | භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය |
|---|---|---|---|
| 2012 | -9417 | 1262 | - 8155 |
| 2013 | - 7609 | 1180 | - 6429 |
| 2014 | - 8287 | 1880 | - 6407 |
| 2015 | - 8430 | 2325 | - 6105 |
| 2016 | -9090 | 2879 | - 6211 |

ClassWork.LK

# ගෙවුම් තුලන ලේඛනයේ අසමතුලිතතාව

ගෙවුම් තුලන ලේඛනයේ අසමතුලිතතාව ලෙස හඳුන්වන්නේ සමස්ත ශේෂයේ හිඟයක් හෝ අතිරික්තයක් හෝ පැවතීම යි.

කිසියම් රටක ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂවල එකතුව එම රට අවශේෂ ලෝකය සමඟ ශුද්ධ ණය හිමියෙක් ද නැතහොත් ශුද්ධ ණය ගැතියෙක් ද යන්න පෙන්නුම් කරයි.

ගෙවුම් තුලන ලේඛනයේ සමස්ත ශේෂය අතිරික්තකට වඩා හිඟයක් පෙන්නුම් කරන විට ආර්ථික වශයෙන් ඉතා ප්‍රබල ප්‍රතිවිපාක ඇති කරයි.

එම නිසා ගෙවුම් තුලන ලේඛනයේ සමස්ත ශේෂයේ කෙටි කාලීන හිඟය පියවීමට අවධානය යොමු කළ යුතු වේ.

ClassWork.LK

## කෙටි කාලීන මූල්‍යයනය

කෙටි කාලීනව හිඟය පියවන්නේ කෙසේ ද යන්න කෙටි කාලීන මූල්‍යයනය කිරීම ලෙස හඳුන්වයි.

## කෙටි කාලීන මූල්‍යයනය කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග

කෙටි කාලීන මූල්‍යයනය කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.

- විදේශ සංචිත යොදා ගැනීම
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබා ගැනීම
- වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් කෙටිකාලීන අරමුදල් ලබා ගැනීම.

ClassWork.LK

## දීර්ඝ කාලීන හිඟයක් පවතින විට ඒ සඳහා ඉදිරිපත් කළ හැකි විසඳුම්

- අපනයන විවිධාංගීකරණය
- සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම
- සාම්ප්‍රදායික අපනයනය දිරිමත් කිරීම
- අපනයන ප්‍රවර්ධන කලාප පිහිටුවීම
- විදේශ රටවල් සමඟ ගිවිසුම්වලට එළඹීම
- විනිමය අනුපාතිකය ක්ෂය වීමට ඉඩ හැරීම හෝ අවප්‍රමාණය කිරීම
- දේශීය උද්ධමනය පාලනය කොට අපනයනවල තරඟකාරීත්වය ඉහළ නැංවීම
- ආනයන ආදේශන කර්මාන්ත වැඩි දියුණු කිරීම
- අත්‍යවශ්‍ය ආනයනය හැර අවශේෂ ආනයනය අධෛර්යවත් කිරීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura